# නිවේදනය

2016 මැයි මස 03 වැනි අඟහරුවාදා පාර්ලිමේන්තුවේ සභා ගර්භය තුළදී සිදු වූ කනගාටුදායක සිද්ධිය සම්බන්ධයෙන් නිවේදනයක් කිරීමට කැමැත්තෙමි.

මෙවැනි අශෝභන සිද්ධීන් හේතුකොට ගෙන පාර්ලිමේන්තුවේ උත්තරීතර භාවයට සහ මෙම සභාවේ ගෞරවයට හානි සිදුවන අතර, මහ ජනතාවගේ දැඩි අප්‍රසාදයට අප පාර්ලිමේන්තුව භාජනය වන බව නොඅනුමානයි.

එවැනි අවස්ථාවන්වලදී පාර්ලිමේන්තුවට මෙන්ම ගරු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාවටද විශාල තර්ජනයක් එල්ල වන බැවින් අනාගතයේදී කිසිදු හෝ ආකාරයකින් මෙවැනි සිද්ධීන් ඇති නොවන බවට වගබලා ගැනීම ජනතා නියෝජිතයන් වශයෙන් අප සියලු දෙනාගේම යුතුකම හා වගකීම බව මම අවධාරණය කරමි.

මෙම සභාවට ම'විසින් ඊයේ අපර භාගයේදී දැනුම් දුන් පරිදි, නියෝජ්‍ය කථානායක, ගරු තිලංග සුමතිපාල මැතිතුමා සහ නියෝජ්‍ය කාරක සභාපති, ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මැතිතුමා විසින් එකී සිද්ධියට අදාළ කරුණු පරීක්ෂා කර බලා මා වෙත වාර්තාවක් ලබාදී ඇත.

මෙවැනි සිද්ධීන් නැවත වරක් ඇති නොවීම තහවුරු කිරීමටත්, මෙම සභාවේ චිරාත් කාලයක සිට පැවත එන උතුම් සම්ප්‍රදායන් ආරක්ෂා කර ගැනීමටත්, පාර්ලිමේන්තුවේ සහ ගරු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහාත්, සභාවේ විනය පවත්වා ගැනීමටත්, පියවර ගත යුතු බව සභාවේ අවධානය යොමු කරවමි.

අදාළ නිරීක්ෂණයන්ට අනුව මෙම සිද්ධිය ආරම්භ වීමට මූලික හේතුව වූයේ විරුද්ධ පාර්ශ්වයේ අසුන්ගෙන සිටි මන්ත්‍රීවරුන් කණ්ඩායමක් සභා ගර්භයට පිවිසී පාර්ලිමේන්තුවේ කටයුතුවලට ඝෝෂා කරමින් බාධා පැමිණවීමත්, ඉන් අනතුරුව ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරුන් කණ්ඩායමක්ද සභා ගර්භයට පිවිසීමෙන් ඇති වූ කලහකාරී තත්ත්වය නිසා මෙම කනගාටුදායක බරපතළ සිද්ධිය ඇති වූ බව සඳහන් කරමි.

මෙම සියලු සිද්ධීන්වලට සම්බන්ධ මන්ත්‍රීවරුන්ගේ ක්‍රියා කලාපය මා දැඩි දෝෂ දර්ශනයට ලක් කරන අතර, මින් ඉදිරියට එබඳු සිද්ධීන් සිදුකර මෙම උත්තරීතර සභාවේ ගෞරවයට හානි වන ආකාරයේ කටයුතු කිරීමෙන් වැළකී සිටින ලෙසත්, පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායයන් හා වරප්‍රසාද නොපිරිහෙළා ආරක්ෂා කරන ලෙසත්, මම අවධාරණය කරමි.

මෙකී සිද්ධියට වගකිව යුතු මන්ත්‍රීවරු න් අතරින් වඩාත් බරපතළ ලෙස විනය විරෝධීව හැසිරී ඇති බවට නිරීක්ෂණය කරන ලද ගරු පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා සහ ගරු ප්‍රසන්න රණවීර මහතා යන මන්ත්‍රීවරුන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 74(2) සමඟ කියවිය යුතු 72(1) ස්ථවර නියෝගය යටතේ එකී මන්ත්‍රීවරුන්ගේ පාර්ලිමේන්තු සේවය එක් සතියක කාලයකට තාවකාලිකව අත් හිටුවීමට අවශ්‍ය යෝජනාවන් මෙම සභාවට ඉදිරිපත් කරන ලෙස සභානායකතුමාගෙන් මම ඉල්ලා සිටිමි.